සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර III විභාගය - 2025 ජුලි

## (303) මූල්‍ය පාලනයන් සහ විගණනය

(Financial Controls & Audit)

2025-07-26
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100.*

---

## <u>A කොටස</u>

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

සංයුක්ත පාලනය (Corporate Governance) යනු, සමාගම් මෙහෙයවන සහ පාලනය කරනු ලබන පද්ධතියයි. සමාගමක අයිතිකරුවන් සහ සමාගම කළමනාකරණය කරන පුද්ගලයින් සෑම විටම එක හා සමාන නොවන බැවින් හොඳ සංයුක්ත පාලනයක් වැදගත් වේ. සංයුක්ත පාලනය සඳහා වූ යහපත් පරිචයන් අඩංගු සංග්‍රහයට අනුව, ලැයිස්තුගත සමාගමක් විසින් විගණන කමිටුවක් ස්ථාපිත කළ යුතුය.

**ඔබ විසින් කළ යුතු දැ:**

(a) හොඳ සංයුක්ත පාලන මූලධර්ම (Good Corporate Governance Principles) අනුගමනය කිරීමෙන් සමාගමකට ලැබෙන වාසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) විගණන කමිටුවේ කාර්යයන් දෙකක්(02) **සඳහන් කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

විගණන ආයතනයක් විසින් තත්ත්ව පාලන පද්ධතියක් ස්ථාපිත කර පවත්වාගෙන යා යුතු අතර, ඒ තුළ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ඇතුළත් වේ. මානව සම්පත් සහ අදාළ සදාචාරාත්මක අවශ්‍යතාවයන්, තත්ත්ව පාලන පද්ධතියක ප්‍රධාන මූලිකාංග වේ.

**ඔබ විසින් කළ යුතු දැ:**

(a) තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංගයක් වශයෙන් "අදාළ සදාචාරාත්මක අවශ්‍යතාවයන්" යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) විගණන ආයතනයක මානව සම්පත්වල නිපුණතාවය සංවර්ධනය කළ හැකි ආකාර දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

**සීමාසහිත Reliance Construction (පෞද්ගලික) සමාගම,** ඉදිකිරීම් ව්‍යාපාරයෙහි නිරත සමාගමක් වන අතර, ඔබගේ විගණන ආයතනය, පසුගිය වසර 5 ක කාලයක් පුරා මෙම සමාගමේ බාහිර විගණක වේ. **සීමාසහිත Reliance Solar (පෞද්ගලික) සමාගම,** 2024 අප්‍රේල් 01 දින සංස්ථාපනය කරන ලද අතර, **සීමාසහිත Reliance Construction (පෞද්ගලික) සමාගමෙහි** පාලිත සමාගමක් වේ. කෙසේවෙතත්, **සීමාසහිත Reliance Solar (පෞද්ගලික) සමාගමෙහි** මෙහෙයුම් කටයුතු කිරීම සඳහා සුදුසුකම් ලත් ඉංජිනේරුවරුන් බඳවා ගැනීමට අපොහොසත් වීම නිසා එම සමාගම විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ලියාපදිංචි වීමට යොමු කරන ලද අයදුම්පත ප්‍රතික්ෂේප විය. තවද, **සීමාසහිත Reliance Solar (පෞද්ගලික) සමාගම** විසින් ව්‍යාපෘති තුනක් (03) බොහෝ දුරට අවසන් කරන ලද අතර, **සීමාසහිත Reliance Construction (පෞද්ගලික) සමාගමෙහි** මෙහෙයුම් අලාභ හා සසඳා බලන විට එම සමාගම අතිශය ඉහළ ලාභාන්තිකයක් පෙන්නුම් කරයි.

**සීමාසහිත Reliance Solar (පෞද්ගලික) සමාගමෙහි** කළමනාකාරිත්වය විසින් එම සමාගමෙහි 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා බාහිර විගණක වශයෙන් ඔබ විගණන ආයතනය පත්කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත Reliance Solar (පෞද්ගලික) සමාගමේ** විගණන කාර්යභාරය බාර ගැනීමට පෙර විගණක විසින් සලකා බැලිය යුතු වැදගත් පැතිකඩයන් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) විගණන කාර්යභාරයක් හැරුණු කොට, සහතිකවීමේ කාර්යභාරයන් සඳහා උදාහරණ දෙකක්(02) **ලැයිස්තුගත කරන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

**Shopping.lk,** යනු විද්‍යුත් වාණිජ්‍ය සමාගමක් වන අතර, එය ශක්තිමත් තරඟකාරිත්ව ඉමක් තීරණාත්මකව පවත්වාගත යුතු දැඩි තරඟකාරීත්වයක් පවතින වෙළෙඳපොළක් තුළ ක්‍රියාත්මක වේ. ඉහළ තරඟකාරීත්වය සහ නිරන්තරයෙන් වෙනස්වන පාරිභෝගික රුචිය හේතුකොට ගෙන වෙළෙඳපොළ කොටස අහිමිවීමේ අවදානමකට සමාගම මුහුණ දෙමින් සිටී. තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා උපායමාර්ගික සැලසුම්කරණය, පරික්ෂාකාරීව අවදානම් හඳුනාගැනීම සහ කාලීනව තක්සේරු කිරීම යනාදිය අත්‍යාවශ්‍ය වන බව **Shopping.lk** විසින් හඳුනාගෙන ඇත. අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා සමාගම විසින් දැනටමත් සමාජ මාධ්‍ය භාවිත කරන අතර, අවදානම් කළමනාකරණ මෙවලමක් ලෙස සමාජ මාධ්‍ය තව දුරටත් උපයෝගී කර ගැනීමට වර්තමානයේ අදහස් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Shopping.lk** හට සමාජ මාධ්‍ය, සඵලදායී අවදානම් කළමනාකරණ මෙවලමක් වන්නේ කෙසේදැයි යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) **Shopping.lk** හි අවදානම් අඩුකර ගැනීම සඳහා භාවිත කරන ශිල්පීය ක්‍රම දෙකක්(02) **හඳුනා දක්වන්න.** (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත Sun Power Solutions (පෞද්ගලික) සමාගම, (SPS)** සූර්ය පැනල ආනයනය කර දේශීය වෙළෙඳපොළෙහි විකිණීමේ ව්‍යාපාරයක නිරතව සිටී. මෙම අයිතම සඳහා දේශීය වෙළෙඳපොළ තුළ සැලකිය යුතු ඉල්ලුමක් පවතින අතර, සමාගම, තම බැංකුවෙන් රු. මිලියන 200 ක ණයක් ලබා ගැනීමට සැලසුම් කරමින් සිටී. ණය මුදල ලබාදීම සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන මෙන් බැංකුව ඉල්ලා තිබේ.

2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **SPS** හි මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ ජ්‍යෙෂ්ඨ විගණක ඔබ වේ.

**SPS** විසින් පිළියෙල කරන ලද කෙටුම්පත් ආදායම් ප්‍රකාශනය පහත පරිදි දැක්වේ:

*(රු.'000)*

| **මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | **2025 (කෙටුම්පත්)** | **2024 (විගණනය කරන ලද)** |
|---|---|---|
| අයභාරය | 350,355 | 390,125 |
| විකුණුම් පිරිවැය | (256,474) | (272,594) |
| **දළ ලාභය** | **93,881** | **117,531** |
| බෙදාහැරීමේ වියදම් | (5,450) | (1,800) |
| පරිපාලන වියදම් | (9,450) | (12,900) |
| මූල්‍ය වියදම් | (18,650) | (9,800) |
| **බදු පෙර ශුද්ධ ලාභය** | **60,331** | **93,031** |
| ආදායම් බදු | (24,800) | (36,800) |
| **බදු පසු ශුද්ධ ලාභය** | **35,531** | **56,231** |

නවතම තාක්ෂණයෙන් යුතු උසස් පැනල වෙළෙඳපොළට ප්‍රවේශ වීම නිසා, පසුගිය වර්ෂයේදී ආනයනය කරන ලද සූර්ය පැනල සඳහා තවදුරටත් ඉල්ලුමක් නොපවතී. මෙම තොගවල වටිනාකම රු. මිලියන 18.26 ක් වූ අතර, ඒවා 2025 මාර්තු 31 දිනට පැවති තොගයේ අන්තර්ගත වේ. තවද, සූර්ය පැනල අලෙවියට අදාල සමහරක් ඉන්වොයිසි, සමාගම සතුව නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **SPS සමාගමේ** විගණන සැලසුම පිළියෙල කිරීමේදී, සළකා බැලිය යුතු කරුණු තුනක්(03) **හඳුනා දක්වන්න**.

(ලකුණු 03)

(b) **SPS සමාගමේ** තොගය විගණනය කිරීමේදී, ඔබ විසින් ඉටුකළ යුතු විගණන පටිපාටි හතරක්(04) **සඳහන් කරන්න.**

(ලකුණු 04)

(c) විගණන නියැදිකරණය (audit sampling) යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි යන්න **පැහැදිලි කරන්න.**

(ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**ජයමාන්න,** 2020 වර්ෂයේදී ව්‍යාපාර කටයුතු ආරම්භ කරන ලද **සීමාසහිත SJ Lanka Construction (පෞද්ගලික) සමාගමේ** අධ්‍යක්ෂවරයෙකු මෙන්ම ප්‍රධාන කොටස්හිමියා ද වේ. අයහපත් ආර්ථික තත්වයන් හේතුවෙන් පසුගිය වර්ෂ කිහිපයේදී ව්‍යාපෘති කිහිපයක් පමණක් සමාගම විසින් සම්පූර්ණ කරන ලදී. සමාගමෙහි ගණකාධිකාරීවරයෙකු සිටි අතර, ඔහු 2024 වර්ෂයේදී ඕස්ට්‍රේලියාවට සංක්‍රමණය විය. අළුතෙන් බඳවා ගන්නා ලද ගණකාධිකාරීවරයා විසින් 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාල විගණනය සිදුකර දෙන ලෙස **ජයමාන්න** විසින් ඔබගේ විගණන ආයතනයෙන් ඉල්ලීමක් කර ඇත.

බදු පෙර ලාභය මත ගණනය කරන ලද විගණන ප්‍රමාණාත්මකභාවය රු.2,500,000/- කි. විගණන කණ්ඩායම විසින් පහත සඳහන් දෑ සොයාගෙන ඇත:

- 2025 මාර්තු 31 දිනට තිබූ තොගයේ කොටසක් වූ රු. මිලියන 8 ක් වටිනා තොගයකට අදාල කිසිදු උපකාරක ලියකියවිල්ලක් සමාගම සතුව නොතිබුණි. තවද, 2025 මාර්තු 31 දිනට පැවති තොගවල පැවැත්ම සත්‍යාපනය (verify) කර ගැනීම සඳහා භෞතික තොග නිරීක්ෂණය කිරීමක් සිදුකර නොමැත. තොග සත්‍යාපනය කර ගැනීම සඳහා විකල්ප විගණන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීමටද විගණකට නොහැකි විය.
- ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා සමාගම විසින් 2024 අප්‍රේල් 01 දින රු. මිලියන 20 ක ණය මුදලක් ලබාගෙන ඇත. ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු 2025 අප්‍රේල් 30 දින අවසන් විය. වර්ෂය සඳහා ණය මත පොලිය වන රු.2,450,000/- ක මුදල, ප්‍රාග්ධන නොනිම් වැඩ ගිණුමට අය කල යුතු වුවද, එය මූල්‍ය වියදම්වලට අයකර ඇත. මූල්‍ය ප්‍රකාශනවලට මෙය ගැලපීමට සමාගමේ කළමනාකාරිත්වය එකඟ වී නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සීමාසහිත SJ Lanka Construction (පෞද්ගලික) සමාගමේ** 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන මත විගණන වාර්තාවේ විගණන මතය කෙරෙහි ඉහත කරුණුවල බලපෑම **තක්සේරු කරන්න**. (ලකුණු 06)

(b) මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේදී, ස්වාධීන විගණකගේ සමස්ත අරමුණු **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

**කුමාර,** වරලත් ගණකාධිකාරී ආයතනයක් වන **WA ඇසෝසියේට්ස්** හි හවුල්කරුවෙකු වන අතර, සංචාරකයින් ප්‍රවාහනය කරනු ලබන බස් රථ තුනක් ඔහු සතුව පවතී. **WA ඇසෝසියේට්ස්,** 2020 වර්ෂයේ සිට **සීමාසහිත RF Hotel (පෞද්ගලික) සමාගමේ** අභ්‍යන්තර විගණක වේ. ඔවුන් විසින් සෑම කාර්තුවකදීම **සීමාසහිත RF Hotel (පෞද්ගලික) සමාගමේ** අභ්‍යන්තර විගණනයක් සිදුකරනු ලබයි. පසුගිය වර්ෂයේදී, **සීමාසහිත RF Hotel (පෞද්ගලික) සමාගමේ** කළමනාකරණය විසින් නව සාමාන්‍යාධිකාරී ලෙස **වීරාජ්** පත්කර ඇත. **කුමාර** සහ **වීරාජ්** පසුගිය විගණනය අවසන් කිරීමේ රැස්වීමේදී එකිනෙකා හමු වූ අතර, **WA ඇසෝසියේට්ස්** විසින් සපයනු ලබන වෘත්තීය සේවාවන් පිළිබඳව **වීරාජ්** සතුටට පත්ව සිටියේය. **සීමාසහිත RF Hotel (පෞද්ගලික) සමාගමේ** කළමනාකාරිත්වයේ අනුමැතිය ඇතිව ඔහු විසින් වාර්ෂික අභ්‍යන්තර විගණන ගාස්තුව 40% කින් ඉහළ නංවා ඇත.

ඔවුන් එකිනෙකා හඳුනා ගැනීමෙන් අනතුරුව, **වීරාජ්** විසින් **කුමාරට** සංචාරක නියෝජිතයන් පිරිසක් හඳුන්වාදෙන ලදී. මෙම සංචාරක නියෝජිතයින් මඟින් **කුමාරට** සංචාරක ප්‍රවාහන අවස්ථාවන් බොහොමයක් හිමි විය. **කුමාරගේ** බස් රථ තුනම ධාවනයට යොදවා ඇති බැවින් වර්තමානයේදී ඔහු හොඳ ලාභයක් උපයනු ලබයි. තවද, ඔහු අළුත්ම බස් රථ දෙකක් මිලදී ගැනීමට ද සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත කරුණුවලට අනුව, ආචාරධර්මවල මූලික මූලධර්මයන්ට අනුකූල වීමේ තර්ජන (threats) දෙකක්(02) **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(b) ඉහත හඳුනාගත් තර්ජන ඉවත් කිරීමට හෝ පිළිගත හැකි මට්ටමකට අඩුකිරීම සඳහා වන ආරක්ෂිත ක්‍රම හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 50)

### 08 වන ප්‍රශ්නය

**සීමාසහිත Luxmi Garment (පෞද්ගලික) සමාගම (LGPL)** *(සමාගම)*, ඇඟළුම් නිෂ්පාදන සමාගමක් වන අතර, බුලත්සිංහල ප්‍රදේශයේ පිහිටි කර්මාන්තශාලාවෙහි සේවකයින් 350 ක් සේවයේ නියුක්තව සිටී. මූල්‍ය කණ්ඩායම, සේවකයින් 6 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන්ගෙන් හතර දෙනෙක් මහරගම තිබෙන ප්‍රධාන කාර්යාලයේත්, දෙදෙනෙක් කර්මාන්තශාලාවේත් සේවය කරති. **රංගි**, කර්මාන්තශාලා කළමනාකරු ලෙස සේවය කරන අතර, සුපරීක්ෂකවරුන් හය දෙනෙකු අධීක්ෂණය කරනු ලබයි.

කර්මාන්තශාලාවට ප්‍රවේශ වීමේදී හා ඉන් පිටවීමේදී සේවකයින් විසින් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිත කළ යුතු වේ. සේවකයින්ගේ පැමිණීමේ වේලාව පෙරවරු 8.30 වේ. සේවකයෙකු පෙරවරු 8.30 න් පසු, එහෙත් පෙරවරු 9.30 ට පෙර පැමිණියහොත් එය කෙටි නිවාඩුවක් (short leave) ලෙස සලකනු ලබයි. සේවකයෙකු පෙරවරු 9.30 ට පසු එහෙත් පස්වරු 12.30 ට පෙර පැමිණියහොත් දවස් භාගයක නිවාඩුවක් ලෙස වාර්තා කරනු ලබයි.

මූල්‍ය විධායක වන **කමල්**, ඇඟිලි සලකුණු මෘදුකාංගයෙන් වාර්තාවක් බාගත කර එය එක්සෙල් පැතුරුම්පතකට (Excel spreadsheet) පරිවර්තනය කර, සෑම මාසයක් අවසානයේදීම ඔහු විසින් දත්ත සමාලෝචනය කරනු ලබයි. මෙම වාර්තාවෙන් අතිකාල පැය පෙන්නුම් කෙරෙන අතර, එය පදනම් කර ගනිමින් අතිකාල ගෙවීම් ගණනය කරනු ලබයි. යම්කිසි විෂමතාවයන් පැවතියහොත් එනම්, සේවකයෙකුගේ පිටව යෑම සටහන් නොවීම, **කමල්** එම ගැටළු සුපරීක්ෂකවරුන් සමඟ සාකච්ඡා කර අදාල නිවැරදි කිරීම් කිසිදු අනුමැතියක් නොමැතිව හස්තමය ආකාරයට (manually) සිදුකරයි. ඉන් අනතුරුව, නිවැරදි කරන ලද වාර්තා, වැටුප් පිළියෙල කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයට යවනු ලබයි. එයට අමතරව, **කමල්** විසින් සේවක අත්තිකාරම් හා සේවක ණය කළමනාකරණය කරනු ලබන අතර, ඊට අදාල වාර්තා හස්තමය ආකාරයට පවත්වා ගනිමින් සේවකයින්ට අත්තිකාරම් මුදලින් ගෙවනු ලබයි.

මූල්‍ය සහායක, **අජිත්** මුදල් අයකැමි වන අතරම සුළු මුදල් අග්‍රිමයද කළමනාකරණය කරනු ලබයි. සමහර අවස්ථාවලදී සුළු මුදල් ගෙවීම් සඳහා විකුණුම් මත දෛනික මුදල් එකතුවීම්ද භාවිත කරනු ලබයි.

ඇඟිලි සලකුණු යන්ත්‍ර හඳුන්වාදීමට පෙර, වැටුප් ලේඛණ සැකසීමේදී ගැටළු කිහිපයක් තිබුණු අතර, ඇඟිලි සලකුණු යන්ත්‍ර සවිකිරීමෙන් පසු එම ගැටළු සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇත. නමුත්, අධ්‍යක්ෂවරයෙකු වන **අසේල**, ඇඟිලි සලකුණු පද්ධති සම්පූර්ණයෙන්ම දෝෂ රහිත වනු ඇතැයි මුලදී විශ්වාස කර ඇති නමුත්, දැන් එහි සමහරක් සීමාවන් පවතින බවට ඔහු විසින් නිරීක්ෂණය කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) COSO අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සංරචක දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) (i) **LGPL** හි අභ්‍යන්තර පාලන දුර්වලතා හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(ii) ඉහතින් හඳුනා ගත් දුර්වලතා මගහරවා ගැනීම සඳහා යෝජනා එක බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) **LGPL** හි සම්පූර්ණයෙන්ම දෝෂ රහිත පාලනයන් තිබිය නොහැකි වන්නේ ඇයිදැයි යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(d) වැටුප් ගෙවීමේ ක්‍රියාවලියෙහි අරමුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(e) තොරතුරු තාක්ෂණ යෙදුම් පාලනයන් තුනක්(03), එක් එක් පාලනය සඳහා උදාහරණයක් ද සමඟ **සඳහන් කරන්න**. (ලකුණු 06)

(මුළු ලකුණු 25)

### 09 වන ප්‍රශ්නය

ඔබ, වරලත් ගණකාධිකාරී ආයතනයක් වන **ABC ඇසෝසියේට්ස්** හි ජ්‍යෙෂ්ඨ විගණක වේ. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සීමාසහිත Wish Hospital (පෞද්ගලික) සමාගමේ (WHPL)** මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ බාහිර විගණක ලෙස ඔබ ආයතනය පත්කර ඇත. **WHPL** මාතෘ රැකවරණය සැපයීම සහ දරුවන්ට ප්‍රතිකාර කිරීම සඳහා විශේෂිත වූ පෞද්ගලික රෝහලක් වේ.

මූලික විගණන සැලසුම් රැස්වීමේදී ඔබ විසින් පහත සඳහන් තොරතුරු සටහන් කරගෙන ඇත:

- රෝහල සතුව නේවාසික රෝගීන් සඳහා ඇඳන් 120 ක්ද, බාහිර රෝගී අංශයක්ද, හදිසි ප්‍රතිකාර අංශයක්ද පවතී. 2025 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන තුල අයභාරය සෑදී ඇති ආකාරය පහත පරිදි වේ:

| අයභාරය | 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා (රු. මිලියන) |
|---|---|
| නේවාසික රෝගීන් මත | 380 |
| බාහිර රෝගී අංශය (OPD), ෆාමසි (Pharmacy) සහ අනෙකුත් සේවා මත | 263 |
| **එකතුව** | **643** |

- වෛද්‍ය ගාස්තු හා වැටුප්වල එකතුව, අයභාරයෙන් 20% ඉක්මවා ඇත.
- රෝහල සතුව ERP මෘදුකාංගයක් (Software) පවතින අතර, සියලුම ගනුදෙනු ඉතා හොඳ පළපුරුද්දක් සහිත මූල්‍ය කණ්ඩායමක් විසින් වාර්තා කරනු ලබයි.
- පසුගිය වර්ෂය හා සසඳා බලන විට, සමාගමේ ලාභාන්තිකය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත.
- මූල්‍ය වාර්තාකරණයට අදාල පාලනයන් පවතින බවට සුදුසුකම්ලත් මූල්‍ය පාලක විසින් තහවුරු කර ඇත.
- ප්‍රධාන විධායක නිලධාරියාගේ ප්‍රසාද දීමනාව වර්ෂයේ අයභාරය ළඟා කර ගැනීම මත තීරණය කර තිබේ.
- WHPL හි පරිපාලක සමාගම වෙත රු. මිලියන 5 ක ණය මුදලක් ලබා දී ඇත.

ඔබගේ විගණන ආයතනය මෙම වර්ෂයේදී පුහුණුවන්නන් 20 දෙනෙකු බඳවාගෙන ඇති අතර, WHPL හි විගණන කටයුතු සිදුකරන අතරතුර, ඔවුන්ට දින 5 ක අනුස්ථාපන වැඩසටහනක් (orientation program) පවත්වන ලෙසට මානව සම්පත් හවුල්කරු ඔබෙන් ඉල්ලා ඇත. ඔවුන් සියළු දෙනා විගණනය විෂයක් වශයෙන් හදාරා ඇති නමුත් කිසිවෙකුට වැඩ පිළිබඳ පළපුරුද්දක් නොමැති බව ඔබ විසින් නිරීක්ෂණය කර ඇත. මානව සම්පත් භාර හවුල්කරුගේ මඟ පෙන්වීම මත විගණනයක් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වාර්තා කිරීමට අදාලව ප්‍රායෝගික පැතිකඩයන් පැහැදිලි කිරීමට ඔබ විසින් WHPL හි විගණනය තෝරාගෙන ඇත. ඔබ විසින් විගණන සේවාදායකගේ අනන්‍යතාවය නිර්නාමිකව තබා ගනිමින් WHPL හි සමහරක් තොරතුරු ඔවුන් සමඟ බෙදාහදාගෙන ඇත. WHPL හි විගණනය සැලකිල්ලට ගෙන පුහුණු අරමුණු සඳහා ඔබ විසින් නිර්මාණය කර ඇති ආකෘතිමය වැඩ පත්‍රිකා (specimen working papers) පුහුණු වැඩසටහන අතරතුරදී පරිශීලනය කරන ලෙස, ඔබ විසින් පුහුණුවන්නන්ගෙන් ඉල්ලීමක් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) WHPL හි විගණන ක්‍රියාවලිය ඉටුකිරීමේදී, විශේෂ අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍ර (areas) හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(b) WHPL හි සමස්ත විගණන උපායමාර්ගයෙහි ඇතුළත් කළ යුතු කරුණු තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(c) විගණක විසින් WHPL සහ එහි පරිසරය පිළිබඳව අවබෝධයක් ලබාගත යුතු ක්ෂේත්‍ර හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(d) WHPL හි වැඩ පත්‍රිකාවල ඇතුළත් කළ යුතු අයිතම පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(e) WHPL සමාගමේ විගණනයේදී සිදුකළ යුතු පහත සඳහන් විගණන ක්‍රියාපටිපාටි වර්ග සඳහා එකිනෙකට උදාහරණ දෙකක්(02) සමඟ **පැහැදිලි කරන්න**:

(i) පරීක්ෂා කිරීම (Inspection).

(ii) විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටි (Analytical procedures). (ලකුණු 06)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |